


ගිය සුමානෙ දවසක් පාන්දර අපේ මාරවිල මලයා් කාගර ගේට්ටුව ගාව නවත්තලා් මල්ලකුත් එල්ලං ඉක්මං ගමනිං එනවා් දැකලා් මං පාර මගට ගියා. මල්ලි මගේ අතට දෙන ගමං' මේක අක්කට දෙන්න - අය්යා් ඕකෙ ඉන්න 'මදුරුවෝ' මං එනකං ඇඳ යටිං හංගලා් තියන්න. මං දවල් කෑමට එනවා. අක්කා්ට කියන්න තෝර මාලු තෙල් විනාකිරය් පොලොස් ඇඹුලය් නැතුව නං කාලා් වැඩක් නෑ කියලා්. මං යනවා් කඩුවෙල ලෙඩෙක් බලන්න'' කියලා් මිනිහා් ආපහු හැරුනා්,

''ඉතිං ඇන්ටා් .. ...හෙට ......''

'' කාරෙ තව දෙන්නෙක් ඉන්නවා්. ඒ ගොල්ලා් යන්නෙ හදිසි ගමනක්. මං යනවා.' කියා ගෙන මිනිහා් අඩියට දෙකට ගියා්. සිරියාවතී හාමිනේ මල්ල ඇතුලෙ හිටිය තෝරය්, පැනිමුලය් අරගෙන ඔන්න පොල් වතුර බෝතලේකුත් තියනවා්' කියා ගෙන කුස්සියට ගියා්.

'හැබෑ නේන්නං මල්ලෙ මදුරුවෙකුත් ඉන්නවය්, කියලා් ඇන්ටා්, කීවා' මං මල්ල පිටිම්ම දංකොටුව ඉස්පිරිත්, බෝතලේ මගේ ඇඳ යටිං ගැන්නුවා්.

යන්තං දොලහ පහු උනා විතරය් මිනිහා ගේට්ටුවෙං කාරෙ මෙහාට හැරෙව්වා්. ඇන්ටා් ආපු සද්දෙට සිරියාවතී හාමිනෙත් කුස්සියෙ ඉඳලා් රෙද්දෙ අත පිහ දම දමා සාලෙට ආවා්.

''ඇන්ටන් මල්ලි ටිකක් කෙට්ටු වෙලා් වගෙය්''

''ඔව් අක්කෙ, අපේ දොස්තර හැමදාම කරුකුරු ගානවා් ඇඟ ටිකක් බස්ස ගන්න කියලා්. ඉතිං මං රෑ බත් කෑම නැවැත්තුවා්. දයාවතී එලෝලු තම්බනවා් රෑට. හුඟක් දවස්වල අපි කව්රුත් රෑට කන්නේ තම්බපු එලෝලු විතරය්. ''ඒක හොඳයි. දයාවතීට නං කෙට්ටු වෙන්න දෙයක් නෑ. කටුස්සි වගේ.'' ඔන්න මල්ලි කියාපු විදියට ම මං ඉව්වා්. අන්නාසි මාලුවකුත් හැදුවා්. මල්ලි මනාප හින්දා්. ''අම්මාට සිරි - හේනං හෙටත් එක්කම කත හැකි ෟ''

ඇන්ටා් ඉස්පිරිත් බාගෙකට තිවාපු වතුර බාගයක් බාගෙකට වැඩ දුන්නේ මිනිහා් මං ඒකෙං අරික්කාලකට තව වතුර කාලක් විතර දාගෙන ඒකෙනුත් බාගයක් ගත්තා.

කෑම කන ගමං මිනිහ එයාගෙ මලයා් ගැන කතාව පටං ගත්තා්. දිව පිටලි පැටලි දොඩන කොට සිරියාවතී හාමිනේ ඒ දිහා බලා හිටියෙ කට ඇරගෙන.

''අප්පුහාමි අස්සයේ සිරියක්කය් හින්දා් පරාන තුනක් බි බේරුණා. අප්පා හ් ඒ සිද්දිය මතක් වෙන කොටත් හී... හීතල ගඩු පිපෙන්නවා්. ගිය සුමානෙ අපේ මලයා්ට කො...කොල්ලෙක් ලැබුනා්. ඇරී අතක් නැහ්. උගේ ම අච්චුව.

''ඒක හරි කතාවක් නේෟ මාසල්ගෙ දරුවා්ට මාසල්ගෙ අච්චුව නැතුව වෙන කාගෙවත්....

'ඔ ඕන්න..... අක්කට විහිලු. ඇත්තෙම්ම අක්කෙ මට පොඩි එකා දක්ක හැටියෙ අපේ තාත්තා් මතක් උනා. මං ම මං අම්මාගෙ පුතාඃ මාසලයා් තාත්තා් ගෙ පුතා....,ෟ

එදා අපේ කතාව ඉවර වෙලා කෑම මේසෙට නැගිටින කොට දෙකක් පහු වෙලා්. ඇන්ටෝ කියපු මදුරු කතාවයි. අපි දෙන්නා් පරාණ තුනක් බේරුණාය කියන කතාවය මේ ඇත්තටම අන්ඩර දෙමළ වගේ හින්දා් මං ඒක කොටිං කියන්නන්කෝ.

මේ ඇත්තො දන්නවා් නේ මදුපානෝස්සව ගැන. ඒ වගේ ම මදුවිත මටි බඳුන ගැනත් අහලා් ඇති නේ. අපේ ඇන්ටා් මදු බෝතලේට දාපු නම තමය් 'මදුරුවා්'. මිනිහ විස්ස විජ්ජාල කාරයෙක් නේ. දවසක් මං අහ ගෙන'' දිය දියර වෙනවා් වගේ 'මදු - මදුර' කරන්නත් පුලුවන් හින්දා් මං' බෝතලේට 'මදුරුවා' ය කියලා් නම දැම්මය කියලා් කව්ද එක්ක කියනවා්. අපේ මලයා හරී ඕකට කියන්නෙ 'වඳුරා' ය කියලා.
අනිත් කතාව නං ටිකක් දිගය්. ඒ වගේම බරපතලය්. ඒකත් මං කෙටිං කියඤ්ඤදංකො.

මාසලුය්, සිසිලියය් නෑ කොමට අය්යය් නංගිය්. ඒ කියන්නේ ඇන්ටලෑ අම්මය් සිසිලියලෑ අම්මය් අක්කා් නගෝ. මුන්දෙන්නා් අය්ය නගෝ කියලා බැලුවෙ නෑ, ඉර මුදුන් සමයං - හඳ මුදු සමයං නැටුවා. මහ ඈයත් හරක් වගේ හිටියා. අන්තිමේ තානායංවලත් ලැග්ගාලු. ඔය්ං මෙය්ං සිසිලියා්ගෙ බඩට දරුවෙක් ආවා්.

මාසලයා්ගේ මහ ජෝඩුවය්, සිසිලියා්ගෙ මහ ජෝඩුවය්, පිස්සු

ඔව් අක්කෙ, අපේ දොස්තර හැමදාම කරුකුරු ගානවා් ඇඟ ටිකක් බස්ස ගන්න කියලා්. ඉතිං මං රෑ බත් කෑම නැවැත්තුවා්. දයාවතී එලෝලු තම්බනවා් රෑට. හුඟක් දවස්වල අපි කව්රුත් රෑට කන්නේ තම්බපු එලෝලු විතරය්.

වැටිලා්. උං මුන්ට සාප කරනවා් දෙස් තියනවා. මුං උන්ට සාප කරනවා්, දොස් කියනවා්.

එක ගොල්ලක් අහනවා් මෙච්චර කල් පුතේ කියාපු එකාට බෑනය් කියන්නෙ කොහොම ද කියලා්. අනික් ගොල්ලෝ අහනවා් 'මෙච්චර කල් දුවේ කියාපු එකීට ලේලිය් කියන්නෙ කොහොම ද කියලා්. නඩුව අන්තිමට 'මහවිසද පණ්ඩිතයෝ - අප්පුහාමි ගාවට ආවා. මට මහවිසද පණ්ඩිත තානාන්තරේ ලැබුනෙත් ඔය නඩුව හින්දා්. මටත් ඉතිං හොඳ ගැම්මක් තිඋනා්. අපේ අමරාදේවී - සිරයාවතී හාමිනේ මං කියන දේට 'එක්පය්ං අත උස්සන බව මේ ඇත්තොත් දන්නවා් නේ' මං ඉතිං නඩුව බාර ගත්තා. ඒ අතරෙ ආරංචියක් ආවා් උන් දෙන්නා් ම වහ බොන්න යනවය් කියලත්.

මං ඉතිං මහ ජෝඩු දෙක මුන ගැහිලා් කිව්වා් හසලෑ තාත්තා් තංගල්ලේ මිනිහෙක්. සිසිලියලෑ තාත්තා කුරුණෑගල මිනිහෙක්. එක්කෙනෙක් සිල්වා්. අනෙකා මනම්පේරී. ඒ දෙන්නා් ගෙ කිසිම ඥාති සම්බන්ධයක් නෑ. දරුවන්ට කියන්නෙ අප්පච්චියේ ලේය කියනවා නේ' ඔය දෙගොල්ලොත් ඒක පිළිගන්නවා් නං මෙතන කිසිම ප්‍රස්නයක් නෑ. තියෙන්නෙ සම්මතයක් කඩ කිරීම විතරය්. අය්යාගෙග් නංගිගෙන් දරුවො ඇවැස්ස නෑනලා මස්සිනාලා්. මහ ඇයෝ එකතු වෙලා් උං උං බන්දනවා. අක්කගෙය් නංගිගෙය් දරුවෝ සහෝදර සහෝදරියෝ කිට්ටු කරන්න බෑ. වෙඩි බේතුයි ගින්දරයි. ඔය සම්මතේ කව්රු හැදුවත් කොහොම හැදුනත් වැරදිය්. බටහිර රටවල මිනිස්සු වගේ එක්කෝ සහෝදර සහෝදරයගෙ දරුවො දෙගොල්ලටම ඒ තහංචිය තියෙන්න ඕන. අපි විජයගේ පැවතෙන මිනිස්සු ලු නේ. විජයගෙ අම්මය් තාත්තය් දෙන්නා් අය්යය් නංගිය් බව මේ ඇත්තො දන්නෑ වෙන්දට?

සිරියාවතී හාමිනෙත් කට පියං හිටියේ නෑ. 'මේ වගේ දේවල් සිරි ලංකාවෙ මීට කලිං සිද්ද වෙලා නෑ නේ.' කියලා් ඇහුවා් මං කව්රු කව්රුත් මුනූ මුනූ බලා ගත්තා්.

දැං හරිනේ ෟ බේරුනු පරාන කාරයො තුන්දෙනා කව්ද කියලා් 'මේ ඇත්තන්ට හිතා ගන්න පුලුවන් නේෟ

## දරු එල අහිමි කතුනට තාක්ෂණයේ පිහිට ලිපියට පසු වදනක්

පසුගිය සන්නස කලාපයේ දරු එල අහිමි කතුනට පිහිට වන්නට අපේ කතුන්ට කළ ආරාධනයට ලැබුණ ප්‍රතාචාර බොහොමකි. දරුඑල අහිමි වීමෙන් පීඩා විඳින අපේ කාන්තාවන්ට මෙන්ම මේ පිලිබඳව උනන්දුවක් දක්වන අයටත් ප්‍රදායකයකු egg donor කෙනෙකු වන්නට පරිත්‍යාගශීලී හදවත් ඇති ඔබට අප ආරාධනා බලා මතක ඇතැයි සිතමි. මේ සඳහා Helping Our Women නමින් ගොඩ නගා ඇති සංවවිධානයට සම්බන්ධ වන ලෙස අපි ඔබෙන් ඉලාලා සිටියෙමු.

මේ සංවිධානය මෙවැනි කතුන් සඳහා වෛද්‍ය උපදෙස්, උපදේශන සේවා සැපයීමටත් එකිනෙකාට කළ හැකි උදව් උපකාර හඳුනාගන්නටත් මං සළසන සාකච්ඡා මන්ඩපයක් බවට පත් කරීමයි අපේ අරමුණ. බොහෝ දෙනෙකු එළිපිට කතා නොකරන මෙවන් මාතෘකාවක් පිලිබඳව සාකච්ඡා කරන්නටත් එමගින් සමාජ සත් කාර්යයකට දායක වන්නටත් හැකි වීම පිළිබඳව සන්නස ඉත සිතින් සතුටු වෙයි.

මේ පිලිබඳව උනන්දුවක් දක්වන අපේ කාන්තාවන්ට මේ සංවිධානය හා එක් වන ලෙසට නැවත වරක් අපි ආරාධනා කරමු. වැඩි විස්තර help1women@yahoo.com හො Helping Our Women PO Box 172 Reservoir Vic 3073 මගින් ලබා ගත හැකි ය.

ඔබ සැමට
සුබ නව වසරක් වේවා
ට්‍රොපිකල් අයිලන්ඩ්
බ්‍රෝඩ්මෙඩෝස්
Trtopical Island
Broadmeadows

## කවදා ද..?

ආසයි හිඳින්නට එක්වී එක පවුලේ
කන්නට බත් ටිකක් හිඳගෙන එක වේලේ
විඳිනට සෙනෙහසක් මව් පිය දෙන්නාගේ
නැත මට කාලයක් මම මෙහෙ තනිවෙන්නේ

ආදර සෙනෙහසක් කිසිවිට නොලැබෙන්නේ
සීතල රස්නෙ ගැන කිසිවිට නොතකන්නේ
ඉගෙනුම සපල කර ගැනුමට වෙහෙසෙන්නේ
දුක් විඳ වුවත් ඒකෙන් සැනසුම ගන්නේ

අත්වල කරගැටයි කොස්සෙන් අතුගාලා
අත්වල ගෙඩි දමයි වස විස ගැවීලා
නෙත් දෙක ගිනි රතුයි නිදිමත වැඩිවීලා
ගත්තේ සැනසුමක් නෙත් කඳුලෙන් තෙමලා

නෙත් දෙක අසනවා කවදද නිදියන්නේ ?
පා දෙක අසනවා කවදද ඉඳගන්නේ ?
කොදු ඇට අසනවා කවදද දිගැදෙන්නේ ?
මගෙ සිත අසනවා කවදද සැනසෙන්නේ ?

අයි.එන්. මුදුන්කොටුව

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243